විෂයත් මට හරිම අප්‍රියයි. ඉස්කෝලේ ගිහිල්ලා කොහොම හරි ඉන්ටවල් එකේදී ආපහු පොත් ටිකත් අරගෙන හොස්ටල් එකට එනවා. ඇවිල්ලා බාත් රූම් එකට වෙලා හැංගිලා ඉන්නවා. ඉස්කෝලේ ඇරෙන වෙලාවට ආපහු ගිහිල්ලා ඉස්කෝලේ ඉඳලා එනවා වගේ එනවා.

මේ වෙනකොට ඔබ සංගීතය විෂයක් විදිහට කොයිතරම් දුරට හදාරල තියනවද?

එහෙම විශේෂ හැදෑරීමක් කියලා දෙයක් කරලා නෑ. විභාගේ ෆේල් වෙලා ගමට ගිහිල්ලා මට කරන්න දෙයක් තිබුණේ නෑ. ආපහු විභාගෙ ගන්න මට හිතුනෙත් නෑ. ගමේ ගිටිය සම වයසේ යාලුවොත් එක්ක එකතුවෙලා මමත් හේන් කෙටුවා. ලී ඉරනවා. කුලී වැඩ කරනවා. පැල් හදාගෙන ඒවායේ තමයි ගොඩක් වෙලාවට ජීවත්වුණේ. ඒ වෙනකොට මම බටහලාවක් අරගෙනයි තිබුණේ. ඉරිගු කරලක් තම්බගන කාලා පැළට වෙලා බටහලාව ගහනවා. එහෙම ඉන්න අතරේ සාමාන්‍ය පෙළ විභාගයේ සංගීතය විෂය විතරක් කරලා මට ඒක පාස් වෙන්න පුළුවන් වුණා. ඒක තමයි විෂයක් විදිහට කරපු හැදෑරීම.

ගැඹුරු හැදෑරීමක් නැතිව සාර්ථක සංගීත නිර්මාණකරුවෙක් වෙන්න බෑ කියලා පිළිගැනීමක් තියනවා නේද?

ගැඹුරු හැදෑරීමක් කරල තිබුණ පමණිනුත් සාර්ථක සංගීත නිර්මාණකරුවෙක් වෙන්න බෑනේද? දැන් බලන්න කේමදාස මාස්ටර්, වික්ටර් රත්නායක, වගේ අය මොහමඩ් සාලි මේ අය කොයිතරම් සාර්ථක සංගීත නිර්මාණකරුවන්ද? ඒත් මේ කවුරුවත් ඔය කියන ගැඹුරු හැදෑරීමක් කළ අය නෙවෙයි. අනික අපි දන්නවා විශාරද විභාග පාස්වෙච්ච සමහර අය ඉන්නවා තනුවක් හදාගන්න බැරි. ඒ නිසා ඔය කියන විදිහේ සම්බන්ධයක් මට ජේන්නේ නෑ.

ගීතයකට සංගීත නිර්මාණය කරනවා කියන එක සංගීතය ගැන විෂයානුබද්ධ දැනුමක් නැති සාමාන්‍ය රසිකයන්ට තේරුම් ගන්න ටිකක් අමාරු දෙයක්. ඔබ ගීයකට සංගීතය නිර්මාණය කරන්නේ කොහොමද කියලා පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

මට ගීත රචනාවක් ලැබුණම මම මුලින්ම බලන්නේ ගීත රචනාවට මගෙන් වෙන්න ඕනේ සාදාරණය මොකක්ද කියලයි. කවුද සිංග් කරන්නේ කියලා බලනවා. ඒ අනුව තමයි ගීතයකට සංගීතය නිර්මාණය කරන්නේ. මොකක්ද මට මේකට අවශ්‍යවෙන සංගීත භාණ්ඩ කියලා මම හිතලා බලනවා. කී බෝඩ් එක හරි ස්ථිනාව හරි තමයි තනු හදන්න ගන්නේ. හිතේ තනුවෙන හැඟීමට අනුව ස්වර යොදලා ප්ලේ කර කර බලනවා. හොඳයි කියලා හිතෙන එක කොළයක ලියා ගන්නවා. ඊට පස්සේ ස්ටුඩියෝ එකකට ගිහිල්ලා මියුසික් ට්‍රැක්ස්ටික වෙනම රෙකෝඩ් කරනවා. ගයිඩ් වොයිස් එකකුත් දාලා තියලා එනවා. පස්සේ වෙලාවක ගායකයා හරි ගායිකාව හරි ඇවිල්ලා වොයිස් කරනවා. දැන්නම් සමහර වෙලාවට සින්දුව කියන්නේ කවුද කියලා අපි දන්නෙත් නෑ පස්සේ දවසක ඇහෙනකම්.

සංගීතවේදීන් කියනවා ගායනා කරන කෙනාගේ හඬට ගැලපෙන විදිහටයි සංගීතය නිර්මාණය කරන්නේ කියලා?

නුගක් වෙලාවට පදමාලාවක් ගෙනත් දෙන-කොට දෙන කෙනා කියනවා මේක සිංග් කරන්නේ අහවලා කියලා. නන්දැක්ක (නන්දා මාලිනී) සිංග් කරනවා කියලා කිව්වොත් මම දන්නවා හදන්න ඕනේ වේන්ජ් එක මොකක්ද කියලා. සනත් අයියට හරි, වික්ටර් අයියට හරි කිව්වොත් ඒත් එහෙමයි. එක එක්කෙනා සිංග් කරන ස්කේල් තියනවානේ. ශිල්පියාට කොච්චර දුරට ඉහළට ගායනා කරන්න පුළුවන්ද පහළට ගායනා කරන්න පුළුවන්ද කියන එක තේරුම් අරගෙන තමයි සින්දුව හදන්නේ. අපි හිතමු නිරෝෂා විරාජිනීට හදන සින්දුවක් කියලා. ඒක බොහොම ඉහළ පිච් එකකින් තරන්නේ. නන්ද-ක්කට හදන එකක් පහළ පිච් එකකින් කරන්නේ. නිරෝෂට හදන සින්දුවක් නන්දැක්කට දුන්නොත් නන්දැක්කා කොච්චර දක්ෂ ගායිකාවක් වුණත් එයාට ඒක කරගන්න බැරිවෙනවා. නන්දැක්කට හදන එකක් නිරෝෂට දුන්නත් වෙන්නේ ඒකමයි. මොකද ඒ ඒ අය සිංග් කරන පිච් එකක්, ස්කේල් තියනවා.

සාමාන්‍යයෙන් ගීයක සංගීත නිර්මාණය කරන්නට ඔබට කොච්චර විතර කාලයක් ගතවෙනවද?

එහෙම කාලයක් කියලා කියන්න බෑ. හිතට සෙට් නැති වචන මාලාවකට තනුවක් කරන්න ගියාම මම හිරවෙන වෙලාවල් තියනවා. හරි අපහසුවෙන්, අකමැත්තෙන් කරලා දෙන්න ඕනේ නිසා කරන ගීත වලට වැඩි වෙලාවක් යනවා.

හොඳ පදමාලාවක් ලැබුණම නුගක් වෙලාවට හෙට රෙකෝඩින් එක තියනවා නම් මම අද රෑට තමයි සින්දුව හදාගන්නේ. පස්සේ කෙලින්ම ස්ටුඩියෝ එකට ගිහිල්ලා රෙකෝඩින් එක කරනවා. 'ඔබයි රමය සඳ කිරණ' කියන ගීතය මම කළේ නන්දා අක්කගේ සරල ගී වැඩසටහනකට. ඒ කාලේ මම ලුණුගල මැණික් ගරනවා. ගුවන් විදුලි වාදක මණ්ඩලේ හිටියට ස්ථිර නෑනේ. ඕනේ වෙලාවක යන්ඩ එන්ඩ පුළුවන්. ලුණුගල පතලට මම ස්ථිනාවත් ගෙනල්ලා තිබුණා. වැඩසටහන හෙට තියෙන්නේ කියලා අද දවල් තමයි ඒ ගීතයට සංගීතය හදාගත්තේ. හදාගෙන කෙලින්ම බස් එකේ නැගලා කොළඹ ආවා.

ඔබ මුලින්ම සංගීතය නිර්මාණය කළ ගීතය මතකද?

ඔව්. මාලිනීගේ 'රජ මැදුරක ඉපදී සිටියානම්' ගීතයට තමයි මට මතක විදිහට මුලින්ම මම සංගීතය නිර්මාණය කළේ. එතකොට මම ගුවන් විදුලි වාදක මණ්ඩලයේ වැඩ කළේ. ඒ කාලේ මාලිනී එහෙම කලායතනයේ ඉඳලා වැඩස-ටහන්වලට ගුවන් විදුලියට එනවා. ඒ අය යාලුවෝ වුණාට පස්සේ මම කලායතනයටත් යන්න පටන් ගත්තා. අහම්බෙන් දවසක් මාලිනීගේ සින්දුවකට මෙලඩියක් දාන්න සිද්ධ වුණා. ඒ වෙනකොට මම මෙලඩි කරලා තිබුණේ නෑ. මාලිනී කිව්වා අයියේ මට මේ සින්දුවක් තියනවා හදලා දෙන්නකෝ කියලා. ඒ වෙනකොට එයා අමරදේව සර් එක්ක හරිම රජ සපා වගේ ගීත කීපයක් කියලා තිබුණේ මගේ හිතේ. ඒ වෙනකොට මාලිනිත් එක්ක මගේ පොඩි හිතවත්කමකුත් තිබුණා. ඉතිං කොහොම හරි මේක කරලා දෙන්නත් ඕනෙනේ. මට හිතට ආව විදිහට කළා.

ඒකට ලැබුණ ප්‍රතිචාර මොනවගේද?

ඔය සින්දුව ජනප්‍රිය වුණාට පස්සේ මට සින්දු ලැබෙන්න පටන්ගත්තා. දවසක රඹුකන සිද්ධාර්ථ හාමුදුරුවෝ ගුවන් විදුලියේදී හම්බවෙලා මට කිව්වා මම ඔයාව හම්බවෙන්න ගිටියේ. ටී.එම්. ජයරත්නට සින්දුවක් තියනවා පුළුවන්ද තනුවක් දාල දෙන්න කියලා. මම ඒක බාරගත්තා. ඒ ගීතය තමයි 'සියක් ආයු ලැබ මගෙත් ආයු ගෙන'. ඒකත් ජනප්‍රිය වුණා.

ගුවන් විදුලි ගීත වලින් පස්සේ ඔබ කැසට් පට සංගීතයටත්, චිත්‍රපටි සංගීතයටත් යොමුවෙනවා. කොහොමද ඒ පැත්තට යොමුවුණේ?

ගුවන් විදුලියට කළ ගීත ජනප්‍රිය වෙනකොට අනෙක් ක්ෂේත්‍රවලිනුත් ඉල්ලුමක් ආවා. දවසක් විජය රාමනායක මටයි රෝහණටයි තවත් කීප දෙනෙකුටයි කතා කළා කැසට්වලට මියුසික් කරන්න. ඒකේ මට හම්බවුණා ටී.එම්. ගෙයි නිලාගෙයි සින්දු කරන්න. 'රත්තරන් නෙන් දෙකින් සළා සිහිල් පවන්' කළේ ඒකෙදි. ඊට කලින් ගුවන් විදුලියේදී පී.එස්.බී. රාණි පෙරේරාගේ වැඩස-ටහනකට ටී.එම්. ට මම සින්දුවක් කරලා තිබුණා.

කාලයක් යනකම් හොදටම බීලා ගිහිල්ලා මම කනත්තේ නිදාගත්ත වාර අප්‍රමාණයි.

'ඔබ හා මෙමා අතිනත් අරන්'. ඒක මුලින්ම හැදුවේ සුනිල් එදිරිසිංහට. සුනිල් කිව්වා මේ වචන මට ඒ තරම්ම සෙට් වෙන්නේ නෑ කියලා. ටී.එම්. කිව්වට පස්සේ ඒ සින්දුව ජනප්‍රිය වුණා.

චිත්‍රපටි සංගීත අධ්‍යක්ෂණය වෙනුවෙන් ඔබ ජනාධිපති සම්මානයට පාත්‍ර වුණත් ඔබ ඒ සම්මාන ප්‍රතික්ෂේප කරනවා. ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ විනිශ්චයන්ට පවා එලෙස අභියෝග කිරීමට ඔබ පෙළඹ ඇත්තම හේතුව මොකක්ද?

මුහුදු ලිහිණි චිත්‍රපටියේ අමරදේව සර් සින්ග් කළ තේමා ගීතය ලිව්වේ අජන්තා රණසිංහ. මම මියුසික් කළේ. ඒකට අසූතුනේ ජනාධිපති සිනමා සම්මාන උත්සවේදී මට හොඳම තනු නිර්මාණයටයි, හොඳම පසුබිම් සංගීතයටයි සම්මාන දෙකක් හම්බ වුණා. ඒත් මම ඒවා ගන්න ගියේ නෑ. ඒ ප්‍රවීණයන්ට අභියෝග කරන්න නෙවෙයි, ඒ අවුරුද්දෙම තමයි ධර්මසිරි බණ්ඩාරනායකගේ 'තුන්වෙනි යාමය' ෆිල්ම් එක තිබුණොත්. කේමදාස මාස්ටර් තමයි ඒකේ සංගීතය කරලා තිබුණේ. මට හිතුනා මට වැඩිය හොඳට තුන්වෙනි යාමය චිත්‍රපටියේ මාස්ටර් සංගීතය කරලා තියනවා කියලා. ඒ නිසා මම සම්මාන ගන්න ගියේ නෑ. ගොඩක් දෙනෙක් මේකට මට දොස් කිව්වා. මාස්ටරුත් දොස් කිව්වා ඇයි ගත්තේ නැත්තේ කියලා. මම කිව්වා හිතට විරුද්ධව කරන්න බෑනේ කියලා. විනිශ්චය මණ්ඩලයේ විනිශ්චයට වැඩිය මට හිතුනා මම කරලා තියන කොටස මදි කියලා. චිත්‍රපටිය කළේ අහලවත්තේ මන්ත්‍රී මෙරිල් කාරියවසම්. එතකොට ඒගොල්ලන්ගේ රජයක් තිබුණේ. මම හිතුවා රජයෙන් මේකට මොකක් හරි අනුග්‍රහයක් ලැබුනාදෝ කියලා. ඒකෙන් පස්සේ මට එන්න තිබුණ චිත්‍රපටි ගොඩක් නැතිවුණා. ඊට පස්සේ එච්.ඩී. ප්‍රේමරත්නගේ 'මංගල තෑග්ග' චිත්‍රපටිය මට ලැබුණා. ඒකේ සනත් අයියට 'වාසනා වේවා' ගීතය කළා. ඒකට සනත් අයියට හොඳම ගායකයා හැටියට සම්මානය ලැබුණා. තවත් ෆිල්ම්ස් කීපයක්ම කළා.

මම ගීතන්නේ ඔබට අන්තිමට ලැබුණ චිත්‍රපටිය එච්.ඩී.ගේ 'විසිදැල්ල', ඒ චිත්‍රපටියේ සංගීත අධ්‍යක්ෂවරයා විදිහට වගකීම් බාරගෙන පස්සේ ඔබ ඒකෙන් අයින්වෙනවා. මොකක්ද එතනදි වුණේ?

මම ඒකේ සින්දු ටික ඔක්කොම හදලා දවසක් එච්.ඩී. මුණගැහුණා. එතනදි මම කිව්වා මේ සින්දුවලට මම මේ මේ ගායක ගායිකාවෝ තෝරගෙන ඉන්නේ කියලා. එච්.ඩී.ට ඕනේ වුණා මම තෝරගන්න අය අයින් කරලා එයා තෝරගෙන ගිටිය පිරිසකට කියලා ඒ සින්දු කියවන්න. මෙ කිව්වා ඔයා චිත්‍රපටියේ අධ්‍යක්ෂ විදිහට නලු නිළියෝ තෝරගන්නවා වගේ තමයි සංගීත අධ්‍යක්ෂ විදිහට ගායක ගායිකාවන් තෝරාගැනීම කරන්නේ මෙයි කියලා. ඉතිං මේක කතා කරලා බේරගන්නම බැරිවුණා. පස්සේ එයා කැමති ගායක ගායිකාවන්ට දීලා එයාටම ඒක කරගන්න කියලා මම හැරිලා ආවා.

ඔබ සංගීත නිර්මාණය කළ බොහෝ ගීතවල සංගීතය හැඟුම්බර සහ ශෝකාතුල සංගීතයක් විදිහටයි අපිට දැනෙන්නේ. අහනකොට හැටවෙන්නේ නෑ. දැහැන්ගත වෙන බවකුයි තියෙන්නේ. ඇයි එහෙම වෙන්නේ?

වේග රිද්ම ශෝෂාකාරි සංගීත නිර්මාණ අඩුවෙන්න මම හැදුන පරිසරයත් බලපාන්න ඇති. අනික මට ලැබෙන පද රචනා හැම එකක්ම වගේ සියුම් සංගීත යෙදවුමකට තමයි සුදුසු. ඒවට ශෝෂාකාරි සංගීතය ගැලපෙන්නේ නෑ. මම ගීතන්නේ ඒක තමයි හේතුව මගේ නිර්මාණවලට හටන්ඩ බැරි.

අමරසිරි පීරිස් ගයන 'ඔබ යන්න ගියා මැකිලා' ගීතය ඔබ සංගීත නිර්මාණය කළ ගී අතුරින් අනුවේදනීය මතකයක් ඉතිරි කළ ගීයක් බව මම තොහේදි හරි අහලා තියනවා?

ඕක මට සුනිල් සරත් පෙරේරා තමයි දුන්නේ. මේකට මෙලඩියක් දාලා අමරසිරිට කියලා රෙකෝඩ් කරලා දෙන්න කියලා. එතකොට මට මතක හැටියට මාලිනී ඇමරිකා ගිහිල්ලා. ඒ දවස්වල මගේ ඔලුව නිකන් අන්ද මන්ද වෙච්ච ගතියක තමයි තිබුණේ. කොහොම හරි ඕකට මියුසික් කරලා අමරසිරිට දීලා මම කිව්වා මට ටිකක් අසනීප ගනියක් වගේ දැනෙනවා. රෙකෝඩ්-න් එකට මට එන්ඩ බැරිවෙයි කියලා. ඒක අමරසිරි කරලා තිබුණා. ඒ ගීතය පටිගත කරලා සතියකින් වගේ තමයි ඇමරිකාවෙදි මාලිනී නැතිවුණා කියන

16 වන පිටට

සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා.....
විවාහ සීනුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.....
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණාමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.....

රහස්‍යභාවය සුරකිමු

සුබෝධා ජෝතිශ්‍ය සේවය

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com